# ලක්දිව දන්ත ධාතූන් වහන්සේගේ ඉතිහාසය
# හා තදාශ්‍රිත පූජාවිධි

ඇඹුරුගමුවේ වජිර ස්ථවිර, බී.ඒ.

PERMANENT REFERENCE

FOR USE IN THE
LIBRARY ONLY

315110

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ දර්ශන විශාරද උපාධිය ( Ph.D )
සඳහා පේරාදෙණි මණ්ඩපයට ඉදිරිපත් කරන ලද නිබන්ධය

1974 ඔක්තෝබර්

## ග්‍රන්ථ සාරය

දළදාවහන්සේ පිළිබඳ ඉතිහාසය ගවේෂණය කිරීමත් උන්වහන්සේ මෙරට සංස්කෘතික ජීවිතය කෙරෙහි බල පෑ ආකාරය ප්‍රකට කිරීමත් මෙම පරීක්ෂණයේ පරමාර්ථය වේ. ලක්දිව අසාමාන්‍ය පූජනීය වස්තුව බවට පත්ව ඇති දළදාව අරභයා විධිමත් වූත් සවිස්තර වූත් ශාස්ත්‍රීය සංග්‍රහයක් දක්නට නොලැබීමේ අඩුව යම්කිසි ප්‍රමාණයකින් හෝ සම්පූර්ණ කිරීමට මෙහිදී දිරි දරන ලදී.

මෙම කෘතිය පරිච්ඡේද හයකට බෙදා ඇත. ප්‍රථම පරිච්ඡේදයේදී දළදා වහන්සේගේ ඉතිහාසය ගොඩනැංවීමට ඉවහල් කර ගත යුතු මූලාශ්‍ර සමාලෝචනය කැරේ. එහිදී ත්‍රිපිටකය හා අත්ථකථා ද පාළි වංසකථා හා සිංහල ප්‍රකරණ ද පුරාවිද්‍යාත්මක සාධක හා ජනකථා, වාචික සාක්ෂි වැනි අනෙක් මූලාශ්‍ර ද අපේ පර්යේෂණයට ඉවහල් වන සැටි සාකච්ඡා කොට ඇත. දෙවැනි පරිච්ඡේදයේදී ධාතු සංකල්පය ප්‍රභව වූ සැටිත් එහි විකාශයත් ත්‍රිපිටක හා අත්ථකථාවන්හි ඒ පිළිබඳව දක්නට ලැබෙන ආකල්පයත් ගැන අවධානය යොමුකොට ඇත. තෙවැනි පරිච්ඡේදයේ සාකච්ඡා කොට ඇත්තේ දළදාවහන්සේ පිළිබඳ ඉතිහාසයය. මෙහිදී ලාංකික ඉතිහාසය හා දළදාවහන්සේ සම්බන්ධ වූ සැටි විස්තර කොට ඇත. දළදාවහන්සේ හා රාජ්‍ය සංස්ථාව අතර පැවති සම්බන්ධය විස්තර වී ඇත්තේ ද මෙම තෙවැනි පරිච්ඡේදයේදිය. දළදාවහන්සේ ලංකාවට වැඩමවීමෙන් පසු ඒ වටා ගොඩනැගුණු පුදපූජා විශේෂයෙන් දැනට මහනුවර දළදා මාළිගයේ සිදු කෙරෙන තේවය හා අනෙකුත් පූජාවිධි සඳහා සිවු වැනි පරිච්ඡේදය මිඩංගු කොට ඇත. පස්වැනි පරිච්ඡේදයේ විෂයක්ෂෙත්‍රය කලින් කල ඉදිකරනලද දළදා මාළිගායි. ඉතිහාසයේ ඒ ඒ යුග තුළ ලක්දිව රජුන් විසින් දළදාවහන්සේවෙනුවෙන් ඉදි කරන ලද දළදා මාළිගා පිළිබඳ අප හමුවේ ඇති තොරතුරු සියල්ල මෙහිදී විමසිල්ලට භාජනය කොට ඇත. ලංකා සංස්කෘතියේ අති - උත්කර්ෂවත් අංගයක් වන ඇසළ පෙරහර සම්බන්ධයෙන් දක්නට ලැබෙන මතවාද ද එහි ඉතිහාසය හා පරමාර්ථය ද පිළිබඳ විමර්ශනයක් හයවැනි පරිච්ඡේදයෙහි ලා සංග්‍රහ කොට ඇත. මීට අමතරව මෙම ග්‍රන්ථයෙහි ප්‍රතිඵල සැකෙවින් ඉදිරිපත් කරන නිගමනය ද දළදාවහන්සේ වැඩ සිටි තැන් නිරූපණය කැරෙන ලංකා සිතියමක් ද ග්‍රන්ථාවසානයෙහි වේ.

සකස් කිරීමේ පහසුව සලකා මෙම ග්‍රන්ථයේ එන කරුණුවලට අදාල ඡායාරූප වෙනම කාණ්ඩයක් වශයෙන් පිළියෙළ කිරීමට තීරණය කරන ලදී.

මෙම පරීක්ෂණය සඳහා භාවිතා කරන ලද්දේ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය මගින් ප්‍රකාශිත ලංකා ඉතිහාසයේ එන රාජ්‍ය වර්ෂ බව සඳහන් කරනු කැමැත්තෙමි.